# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 679/12 — 1991 සැප්තැම්බර් 11 වැනි බදාදා — 1991.09.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—ඕ 21/78 II

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1985 අංක 7 දරන පනතින් සංශෝධිත, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 88 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය විසින් සාදන ලද නියමාවලිය.

ඩබ්ලිව්.ආර්.එම්. වික්‍රමසිංහ,<br>
ලේකම්,<br>
විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය.

1991 සැප්තැම්බර් මස 10 වන දින,<br>
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙ නියමාවලිය 1991 අංක 1 දරන විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩල නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ විට බලාත්මක විය යුතුය.

2. (1) (මෙහි මින් මතු ''අභියාචන මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය, එය විසින් තීරණය කරනු ලබන වාර ගණනක්, එසේ තීරණය කරනු ලබන වේලාවන්හිදී හා ස්ථානවලදී රැස්විය යුතුය.

(2) අභියාචන මණ්ඩලයේ සභාපතිවරයාගේ එකඟත්වය ඇතිව ලේකම් වරයා විසින් අභියාචන මණ්ඩලයේ සියළුම රැස්වීම් කැඳවනු ලැබිය යුතුය.

(3) ලේකම්වරයා විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා පොතක අභියාචන මණ්ඩලයේ එක් එක් රැස්වීමේ වාර්තාව ඔහු විසින් සටහන් කරනු ලැබිය යුතුය.

(4) විභාග කිරීමට නියමිතව ඇති කාරණා පිළිබඳ ලිපිගොනුවල සහ බැහැර කර ඇති කාරණාපිළිබඳ ලිපිගොනුවල භාරකාරත්වය සම්බන්ධයෙන් ලේකම්වරයා වගකිව යුතුය.

3. (1) පනතේ 86 (අ) වගන්තිය යටතේ අභියාචන මණ්ඩලය විසින් විමර්ශනයක් පැවැත්වීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම, උල්ලංඝනය කරන ලදැයි ඉල්ලුම්කරු විසින් චෝදනා නගා ඇති බඳවා ගැනීමේ පරිපාටිය නැතහොත් පත්'කිරීමේ හෝ උසස් කිරීමෙ පරිපාටිය සහ ඒ උල්ලංඝනය කිරීම කර ඇති ආකාරය පිළිබඳ විස්තර, අංකිත ඡේද අනුව සැකෙවින් දැක්විය යුතු පෙත්සමක මාර්ගයෙන් විය යුතුය

(2) එවැනි සෑම පෙත්සමක්ම සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරුලියනය කර ඉල්ලුම්කරු විසින් අත්සන් කොට ඊට දාතම යොදනු ලැබිය යුතු අතර, විශ්වාසය තබා ඇති ලේඛනවල පිටපත් සමග එය එවනු ලැබිය යුතුය.

(3) අභියාචනය කරනු ලබන්නේ කරන ලැදැයි කියනු ලබන යම් උල්ලංඝනය කිරීමකට විරුද්ධවද ඒ උල්ලංඝනය කිරීමෙන් මාස තුනක් ඇතුළත ඒ පෙත්සම සහ ඒ ලේඛනවල පිටපත් වේ නම්, ඒ පිටපත්ද, පිටපත් පහකින් යුතුව ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

4. (1) පනතේ 86(ආ) වගන්තිය යටතේ අභියාචන මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවා නියුක්තයන් විසින් ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක්ම, පහත සඳහන් විස්තර, අංකිත ඡේද අනුව සැකෙවින් දැක්විය යුතු පෙත්සමක මාර්ගයෙන් විය යුතුය:—

(අ) අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ක්‍රියාවට, තීරණයකට හෝ නියමයකට විරුද්ධවද, ඒ තැනැත්තා හෝ තැනැත්තන් ;

(ආ) අභියාචනය කරනු ලබන්නේ යම් ක්‍රියාවකට, තීරණයකට හෝ නියමයකට විරුද්ධවද, ඒ ක්‍රියාව, තීරණය හෝ නියමය ;

(ඇ) අභියාචනයට හේතු ; සහ

(ඈ) ඉල්ලා සිටින සහනයේ ස්වභාවය.

(2) එවැනි සෑම පෙත්සමක්ට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරුලියනය කර, අභියාචක විසින් අත්සන් කොට ඊට දාතම යොදනු ලැබිය යුතු අතර, විශ්වාසය තබා ඇති ලේඛනවල පිටපත් සමග එවිය යුතුය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් ක්‍රියාවකින්, තීරණයකින් හෝ නියමයකින්ද එම ක්‍රියාවේ, තීරණය හෝ නියමයේ දින සිට මාස තුනක් ඇතුළත ඒ පෙත්සම සහ ඒ ලේඛනවල පිටපත් වේ නම්, ඒ පිටපත්ද, පිටපත් පහකින් යුතුව ලේකම්වරයා වෙත ඉදිරිපත්කරනු ලැබිය යුතුය.

5. (1) පනතේ 86(ඇ) වගන්තිය යටතේ අභියාචන මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා පරණ විශ්වවිද්‍යාලයේ හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවකයන්ව සිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවා නියුක්තියන් විසින්, ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක්ම, පහත සඳහන් විස්තර, අංකික ඡේද අනුව සැකෙවින් දැක්විය යුතු පෙත්සමක මාර්ගයෙන් විය යුතුය :—

(අ) පෙත්සම්කරු පරණ විශ්වවිද්‍යාලයේ සේවයෙහි නියුක්තව සිටි කාල සීමාව ;

(ආ) පනතේ 142 වන වගන්තිය යටතේ පෙත්සම්කරුට ලැබුනු යම් පාරිතෝෂික මුදලක්, විශ්‍රාම යාමේ දීමනාවක් හෝ වන්දියක් වේ නම්, ඒ පාරිතෝෂික මුදල්, විශ්‍රාම යාමේ දීමනාව හෝ වන්දිය ; සහ

(ඇ) පෙත්සම්කරු විසින් තමාට ලැබිය යුතු බවට හිමිකම් පා ඇති වන්දි මුදල, සහ එම වන්දි මුදල ආගණනය කර ඇති ආකාරය.

(2) ඒ සෑම පෙත්සමක්ම සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරුලියනය කර, පෙත්සම්කරු විසින් අත්සන් කොට ඊට දාතමය යොදනු ලැබිය යුතු අතර, විශ්වාසය තබාඇති ලේඛනවල පිටපත් සමඟ එය එවනු ලැබිය යුතුය.

(3) ඒ පාරිතෝෂිකය, විශ්‍රාමයාමේ දීමනාව හෝ වන්දිය ගෙවීමට තිරණය කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ඒ පොත්සම සහ ඒ ලේඛනවල පිටපත් වේ නම්, ඒ, පිටපත්ද පිටපත් පහකින් යුක්තව ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. කෙසේ වුවද, එකී මාස තුනක කාලය ඉකුත්වීමෙන් පසුව, ලේකම් වරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තාවූ, 3 වන ඡේදයෙහි සඳහන් ඉල්ලීමක් හෝ 4 වන සහ 5 වන ඡේදවල සඳහන් පෙත්සමක්, අවස්ථා වෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ පෙත්සම්කරු විසින් ඉදිරිපත්කරන ලද ප්‍රමාණවත් කරුණු මත අභියාචන මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි භාරගනු ලැබිය හැකිය.

7. 3 වන ඡේදය යටතේ ඉල්ලීමක් හෝ 4 වන හෝ 5 වන ඡේදය යටතේ පෙත්සමක් ලැබුන විට, ලේකම්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීම හෝ පෙත්සම ලැබුන දිනය සඳහන් කරමින් එය ලියාපදිංචි කොට, ඊට අනුක්‍රමික අංකයක් යෙදිය යුතුය.

8. 3 වන ඡේදයේ සඳහන් ඉල්ලීමක් හෝ 4 වන හෝ 5 වන ඡේදවල සඳහන් පෙත්සමක් එහි ස්වභාවය අනුව නිස්සාර යයි හෝ පීඩාකාරි යයි නැතහොත් අපකීර්තිදායක කාරණා එහි ඇතුළත් යයි හෝ අභියාචන මණ්ඩලයේ බල සීමාවට බාහිර යයි අභියාචන මණ්ඩලයේ මතය වන්නේ නම්, මූලික සලකා බැලීමකින් පසුව අභියාචන මණ්ඩලය විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු අභියාචන මණ්ඩලය විසින් ඉල්ලුම්කරු හෝ පෙත්සම්කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දිය යුතුය.

9. 3 වන ඡේදය යටතේ වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් හෝ 4 වන හෝ 5 වන ඡේදය යටතේවූ පෙත්සමක් සම්බන්ධයෙන් පවත්වනු ලබන්නාවූ යම් නඩු කටයුතු වලදී, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක් වගඋත්තරකරුවන් කරනු ලැබිය යුතුය.

10. අභියාචන මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුව හොත් මිස, අමුණා ඇති යම් ලේඛනවල පිටපත් සමඟ පෙත්සමේ එක් පිටපතක්, ලේකම්වරයා විසින් ලියාපදිංචි තැපෑලෙන් වගඋත්තරකරු වෙත යැවිය යුතුය.

11. 10 වන ඡේදයේ සඳහන් පෙත්සම සහ ලේඛන කිසිවක් තමා වෙත ලැබුන දින සිට සති තුනක් ඇතුළත වගඋත්තරකරු විසින්, තමා විශ්වාසය තැබීමට බලාපොරොත්තු වන යම් ලේඛනවල පිටපත් ද සමඟ තම උත්තරය පිටපත් හතරකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

12. වගඋත්තරකරුගේ ඉල්ලීමක් උඩ අභියාචන මණ්ඩලය විසින් ඔහුගේ උත්තරය හා ලේඛනවල පිටපත් ඉදිරිපත් කිරීම සඳහා සති තුනක් කල්දීමක් කල හැකිය.

13. වගඋත්තරකරු විසින්, 11 වන ඡේදයේ සඳහන් යම් ලේඛනවල පිටපත් ද සමඟ උත්තරයේ එක් පිටපතක්, ලියාපදිංචි තැපෑලෙන්, අවස්ථා වෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ පෙත්සම්කරු වෙත යැවිය යුතුය.

14. උත්තර සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරුලියනය කර වගඋත්තරකරු විසින් අත්සන් කොට ඊට දාතම යොදනු ලැබිය යුතුය.

15. උත්තරය ලැබුන විට අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ඉල්ලීම හෝ පෙත්සම විභාගකිරීම සඳහා දිනයක් නියමකළ යුතු අතර විභාගය සඳහාවූ ඒ දැන්වීම ලේකම්වරයා විසින් පාර්ශවකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතුය.

16. 3 වන, 4 වන, 5 වන සහ 11 වන ඡේද යටතේ ලේකම්වරයා වෙත ඉදිරිපත්කර ඇත්තේ යම් ලේඛනවල පිටපත්ද, ඒ සියළු ලේඛනවල මුල් පිටපත් එක් එක් පාර්ශවකරු විසින්, ඉල්ලීම හෝ පෙත්සම විභාගකරන අවස්ථාවේදී අභියාචන මණ්ඩලයට ලබාගැනීමට සැලැස්විය යුතුය.

17. (1) අභියාචන මණ්ඩලය ඉදිරියේ පවත්වනු ලබන යම් නඩු කටයුත්තක එක් එක් පාර්ශවකරු විසින් පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මාර්ගයෙන් හෝ අභියාචන මණ්ඩලයේ අවසරය ඇතිව රජයේ සේවකයකු හෝ කලින් සිටි රජයේ සේවකයකු හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවා නියුක්තයකු හෝ කලින් සිටි සේවා නියුක්තයකු හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවා නියුක්ත යකු හෝ කලින් සිටි සේවානියුක්තයකු විය හැකි නියෝජිතයකු මාර්ගයෙන් පෙනී සිටිය හැක.

(2) පාර්ශවකරුවකු නීතිඥවරයකු මගින් හෝ නියෝජිතයකු මගින් පෙනී සිටී නම් ඔහු විසින් ඒ පිළිබඳව අනිත් පාර්ශවයට හෝ පාර්ශවයන්ට විභාගයට නියමිත දිනයට අවම වශයෙන් සති දෙකකට කලින් දැනුම්දිය යුතුය.

18. ඉල්ලීම හෝ පෙත්සම විභාග කරන අවස්ථාවේදී කරුනු දැක්වීමට හා ලේඛන ඉදිරිපත් කිරීමට එක් එක් පාර්ශවකරුට හෝ ඔහුගේ නීතිඥ වරයාට හෝ නියෝජිතයාට හිමිකම් තිබියයුතු නමුත්, වාචික සාක්ෂි මෙහෙයවනු ලැබීමට සාමාන්‍යයෙන් අවසර දෙනු නොලැබේ. කෙසේවුවද, යුක්තිය අනුව අවශ්‍ය යයි හැගියන අවස්ථාවන්හිදී අභියාචන මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි, ඒ විභාගකිරීමේදී වාචික සාක්ෂ මෙහෙයවීමට අවසර දෙනු ලැබීය හැකිය.

19. (1) මේ නියමාවලිය යටතේ අභියාචන මණ්ඩලයේ තීරණය සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම කාරණා, අභියාචන මණ්ඩලයේ බහුතර තීරණයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(2) අභියාචන මණ්ඩලයේ අවසන් තීරණය පාර්ශවකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දෙනු ලැබිය යුතුය. එම තීරණයේ පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙතද යැවිය යුතුය.

20. ස්වකීය බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සහ ස්වකීය කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීම සඳහා අවශ්‍ය යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනුකූල නොවන යම් ක්‍රියා කිරීම හා යම් විධානයක් දීම සඳහා අභියාචන මණ්ඩලයට ඇති බලයට මේ නියමාවලියේ ඇතුළත් කිසිවකින් හානියක්නොවිය යුතුය.

21. මණ්ඩලය සමග කරනු ලබන සියළු ලිපි කටයුතු ලේකම්වරයාගේ පහත දැක්වෙන දනට ඇති ලිපිනයට එවිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20', 'වෝඩ්පෙදෙස, කොළඹ 07.

22. මේ නියමාවලියේ—

"පනත" යන්නෙන්, 1989 අංක 3 දරන පනතින් අවසන්වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"ලේකම්වරයා" යන්නෙන්, පනතේ 84 වගන්තියේ සඳහන් විශ්ව විද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ ලේකම්වරයා අදහස් වේ.

09-579

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී